# 多言語情報コーナー （令和６年　８月号）

**ආපදා වැළැක්වීම පිළිබඳ විශේෂාංගය**

**1. ආපදා සම්බන්ද"ඉවත් කිරීම්" දෙකක් පිළිබඳ ඔබ දැනුවත්ද**

ඉදිරි කාලයේ සුළි කුණාටු මගින් අධික වර්ෂාව ඇතිවී ආපදා ඇතිවියහැකි කාලයකි.
අපදා යන වචනය ඔබට නිතර ඇසෙන වචනයකි. ඇත්ත වශයෙන්ම ඉවත් කිරීම් වර්ග දෙකක් ඇති බව ඔබ දන්නවාද. "හදිසි ඉවත් කිරීම" සහ "අපදාවෙන් පසු ජීවිතය යනුවෙනි. සමාන බවක් පෙනෙන්නට ඇති නමුත් ඇත්ත වශයෙන්ම වෙනස් වන මෙම "ඉවත්කිරීම්" දෙකේ වෙනස දැනගැනීම ඉතා වැදගත් වේ.

"හදිසි ඉවත් කිරීම" යන්නෙන් අදහස් කරන්නේ විපතක් සිදු වූ විට හෝ සිදුවීමට ඉඩ ඇති අවස්ථාවල ජීවිත ආරක්ෂාකර ගැනීම සඳහා කටයුතු කිරීමයි. නිදසුනක් වශයෙන්, ජලගැලීම් අවස්ථාවකදී ගංවතුරේ ගැඹුරට වඩා ඉහළ ස්ථානයක් හෝ ගංවතුරක් ඇති නොවන ස්ථානයක්, නායයෑම් ආපදා අනතුරු ඇඟවීමේ ප්‍රදේශයකින් පිටත ආපදාවක් සිදු වූ විට හෝ ආපදා අවදානමක් ඇති විට. හදිසි ඉවත්කිරීමේ කාලපරිච්ඡේදය තුළ ආරක්ෂිත ස්ථානයක රැඳී සිටීම හදිසි ඉවත් කිරීමක් වේ.

\`\`ආපදාවෙන් පසු ජීවිතය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකුගේ ජීවිතය බේරා ගැනීමෙන් පසු සිදුවූ ආපදාව හේතුවෙන් නිවාස හා නිවාස ඇති ප්‍රදේශ සාමාන්‍ය ජනජීවිතය ගතකිරීමට නොහැකි අවස්ථාවලදී ආපදා මධ්‍යස්ථාන වල තාවකාලිකව වාසය කිරීම වේ.

සාමාන්‍යයෙන්, "ආපදාවක් " යන්නෙන් අදහස් කරන්නේ "නගරයේ හදිසි ඉවත් කිරීමේ ස්ථානයට යාම", වන අදහස වනු නමුත් විශාල පිරිසක් එකවර වාසය කරන ආපදා මද්‍යස්ථානයට වඩා තමා සිටින නිවාස ආරක්ෂිත ස්ථානයක් නම් තම නිවසින් පිටවීම සුදුසු නොවේ. මීට අමතරව, ගංවතුර දැනටමත් ආරම්භ වී ඇත්නම්, ආරක්ෂිත ස්ථානයක් ලෙස දෙවන මහලේ සිට ඉහල ස්ථාන වෙත යාම සුදුසු වේ.

ආපදා තත්ත්වය අනුව ඉවත් කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.

## 2. ඉවත්ව යන වේලාව තීරණය කිරීම

ගංවතුර හෝ නාය යෑමේ ව්‍යසනයකින් හදිසි ඉවත් කිරීමක් සිදු කළ යුත්තේ කවදාද යන්න තීරණය කිරීම සඳහා, තොරතුරු රැස් කිරීම වැදගත් වේ. පරිගණක, ස්මාර්ට්ෆෝන්, රූපවාහිනිය සහ ගුවන්විදුලිය මගින් හදිසි අවස්ථාවකදී තොරතුරු ලබාදීමේ ක්‍රම බැවින් එම තොරතුරු එක්රැස් කිරීම ඔබට ආරක්ෂා වීමට උපකාර වේ.

සුළි කුණාටුවක් මගින් ඇතිවන අධික වර්ෂාව හේතුවෙන් ``'පස්වන මට්ටමේ අවදානම් තත්වයක් ප්‍රකාශ කළහොත් එම අනතුරු හැගවීමත් සමගම බොහෝවිට හදිසි ඉවත් වීමේ නියෝගයක් ලැබීමට හැකියාව ඇත.සුළු හෝ ජීවිත අවදානමක් ඇතිනම් ඉතා ඉක්මනින් ආරක්ෂිත ස්ථාන වෙත යාම සිදුකරන්න.

නොකඩවා ඇද හැලෙන අධික වර්ෂාව පිළිබඳ අවදානයෙන් සිටියද "4 වන මට්ටමේ අවදානම් තත්වයක් ඇති වුවහොත් අප ඉන්නේ ඕනෑම වෙලාවක විපතක් සිදුවිය හැකි තත්ත්වයකය. කරුණාකර හැකි ඉක්මනින් සියලු දෙනා ආරක්ෂිත ස්ථානයක් වෙත ඉවත් විය යුතුය.

තොචිගි නගර ශාලාව මගින් `` 3 වන මට්ටම අවදානම් තත්වයක් සමග වැඩිහිටියන්ද සමග ඉවත් වීමේ අවදානම් පණිවිඩයක් නිකුත් කල අවස්ථාවක හදිසි ආපදාවක් ඇතිවීමේ අවස්ථාව ඉතා ඉහල බැවින් ඉවත් වීමට කාලය ගත විය හැකි වැඩිහිටි පුද්ගලයින් වහාම ඉවත් විය යුතුය.

``2 වන මට්ටමේ අවදානම් තත්වයකදී තමන් විසින්ම ඉවත්වීමේ ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය. එමගි අදහස් වන්නේ විශාල සහ ප්‍රබල තත්වයේ සුළි කුණාටුවක් ළඟා වෙමින් තිබේන බවයි. කාලගුණ අනාවැකි ආදිය මගින් ඉදිරියට ගතයුතු ක්‍රියාමාර්ග පිලිබදව දැනුවත් වන්න.

ඉහත සදහා එක් එක් ආපදා තත්ත්වයකදී ඔබ ආරක්ෂාකාරී වන්නේ කෙසේද යන්න පිලිබදව පෙර දැනුවත් වීමක් තිබීම මගීන් ඔබගේ ජීවිතය ආරක්ෂා කරගත හැක.

## 3. "හදිසි ආපදා අවස්ථාවක භාවිතා කරන භාණ්ඩ" සහ "තොග වශයෙන් රැස් කර තබා ගතයුතු භාණ්ඩ"

හදිසි ඉවත් වීමකදී අපට අවශ්‍ය භාණ්ඩ සහ ආපදාවකින් පසු ආපදා මද්යස්ථානයක් තුල සිටීමේදී අවශ්‍ය වන භාණ්ඩ එකිනෙකට සමාන නොවේ.එම එක එක් අවස්ථාවල භාවිතා වන භාණ්ඩ පිළිබඳ ඔබට දැනුවත් භාවයක් තිබේද

"හදිසි අවස්ථාවකදී ඔබ සමඟ රැගෙන යා යුතු භාණ්ඩ " යනු ඔබ තාවකාලිකව රැදීසිටින ස්ථානයේ එක් රාත්‍රියක් රැඳී සිටීමේ අරමුණින් ඔබට අවශ්‍ය වන භාණ්ඩ වේ. ආහාර, හදිසි වෛද්‍ය ද්‍රව්‍ය, දෛනික අවශ්‍යතා, ඇඳුම් පැළඳුම්, වටිනා භාණ්ඩ, වැඩිහිටියන්, ළදරුවන් හෝ කුඩා දරුවන් සිටින විට අවශ්‍ය භාණ්ඩ සහ සුරතල් සතෙකු සිටින විට ඒ සඳහා අවශ්‍ය කරන අයිතම ද සූදානම් කරන්න.

තවද හදිසි ආපදාවක් සිදුවී සැපයුම් මාර්ග නැතිවීමකදී එනම් විදුලිය සහ ජලය වැනි අත්‍යවශ්‍ය සේවා නැතිවිය හැක.එවැනි අවස්ථාවකදී ඔබේ දෛනික ජීවිතයට අවශ්‍ය දෑ දින තුනකට හෝ හැකි නම්, දින හතක් සඳහා රැස්කර තබා ගැනීමට වග බලා ගන්න.

හදිසි අවස්ථාවක් සඳහා ගබඩාකර තබාගත යුතු පානීය ජලය දිනකට එක් පුද්ගලයෙකුට දලවශයෙන් ලීටර් 3ක් බව සලකනු ලැබේ. අතේ රැගෙන යා හැකි වැසිකිළියක් තිබීම ඉතාමත් ප්‍රයෝජනවත් වේ.

ආහාර ගබඩා ක තබා ගැනීමේදී අප නිර්දේශ කරන්නේ "rolling stock" යන ක්‍රමයයි.එනම් ඔබ සාමාන්‍යයෙන් එදිනෙදා ආහාරයට ගන්නා ද්‍රව්‍ය සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් මිලදී ගෙන එම ද්‍රව්‍ය එදිනෙදා භාවිතාකරන ප්‍රමාණය නැවත නැවත මිලදී ගෙන එම අඩුව පිරවීමයි.මෙම ක්‍රමය නැවත නැවත කිරීමෙන් සැම විටම වැඩි ප්‍රමාණයක් ගබඩාවී තිබීම නිසා යම් හදිසි ආපදා අවස්ථාවකදී මෙම ද්‍රව්‍ය භාවිතා කිරීමට හැකි වීමයි.

"ආපදා වැළැක්වීමේ දැනුවත්භාවය වැඩි කිරීම " යන වාක්‍ය ඇසෙන විට, අපි එය ආරක්ෂක ක්‍රියාමාර්ගයක් ලෙස සිතීමට නැඹුරු වෙමු, නමුත් අපගේ එදිනෙදා ජීවිතයේදී, අපි ටිකෙන් ටික ආපදා වැළැක්වීම වෙනුවෙන් උනන්දු වෙමු.